"ජලය මානව හිමිකමකි - සුව රැකුම අභිමානයකි"

# ජල සම්පාදන අමාත්‍යාංශය

## ලෝක බැංකුවේ සහය ලබන ජලසම්පාදනය හා සනීපාරක්ෂකතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)

ලෝක බැංකු සහාය ලබන ජල සම්පාදනය හා සනීපාරක්ෂකතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල සනීපාරක්ෂකතාව වැඩි දියුණු කිරීම හා නළගත ජල ප්‍රවේශ සේවාවන් වැඩි දියුණු කිරීම හා පානීය ජල අංශයේ ආයතනවල ශක්‍යතාව / ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ කාර්යාලය (PDO) කොළඹ ස්ථාපිත කර ඇති අතර, දිස්ත්‍රික්ක ආධාරක ඒකකය (DSUS) එක් එක් දිස්ත්‍රික්කයක එකක් (01) බැගින් ස්ථාපිත කරණු ලැබ ඇත. සමස්ත ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ. එ.ජ. ඩොලර් මිලියන 223 කි.

පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් සතුව පහත සඳහන් අවම සුදුසුකම් තිබිය යුතුය.

## ප්‍රධාන ඉංජිනේරු තනතුර (PS 3)

**ස්ථානය**

**නුවරඑළිය දිස්ත්‍රික්කය (ඇබෑර්තු 1 යි)**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම සමග ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය (IESL)

සමග

අවම වශයෙන් වසර 9 යක කළමනාකරණ මට්ටමේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් අවම වශයෙන් වසර 5 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂකතාව අංශයේ විය යුතුය.

**ඉහත සඳහන් තනතුර සඳහා පොදු කොන්දේසි :**

**වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 65 වඩා අඩුවිය යුතුය.

**වැටුප් පරිමාණය**

වැටුප් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2019/01 මත පදනම් වනු ඇත.

**සේවා නියමයන් හා කොන්දේසි**

පත්වීම මූලිකව එක් වසරක කාල සීමාවකට කොන්ත්‍රාත් පදනම මත වනු ඇති අතර, සතුටුදායක කාර්ය සාධන ඇගයීම මත නැවත වාර්ෂිකව අලුත් කරවා ගත හැකිය. කළමනාකරණ සේවා චක්‍රලේඛ 2019/01 හි සඳහන් සියලු කොන්දේසි පත්වීමට අදාළ වනු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

උසස් හා ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව, කෙටි ලැයිස්තුගත කරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය මත පදනම්ව සිදු කරනු ලැබේ.

අයදුම්කරුවන් ජීව දත්ත තොරතුරු සමග අයදුම්පත්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද හා පෙර / පසුගිය සේවා වාර්තා ආදිය පිළිබඳ සියලු සහතිකපත්‍රවල පිටපත්ද සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබෙන සේ 2022 පෙබරවාරි මස 4 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි සටහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ / ආයතනික අංශයේ ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ජල සම්පාදන හා සනීපාරක්ෂකතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**අංක 230, ඊ ඩබ්ලිව් පෙරේරා මාවත,**
**ජුබිලි කණුව, නුගේගොඩ.**